JMC vLearning
"your virtual learning partner"

# සමාගම් බදුකරණය

## AAT අදියර III
## CPT - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

නුවන් සමීර
B.Sc. (Accountancy) Sp., CBA, ACCA Finalist

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

# සමාගම් බදුකරණය (Company Taxation)

_______________ සමාගම

_______________තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය

| | | |
|---|---|---|
| ව්‍යාපාර ආදායම | | xxx |
| ආයෝජන ආදායම | | xxx |
| වෙනත් ආදායම | | xxx |
| මුලු තක්සේරු වන ආදායම (Total Assesable Income) | | xxxx |
| (-) 52 වන වගන්තිය අනුව සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන | | (xxx) |
| බදුවන ආදායම (Taxable Income) | | xxx |
| **<u>දළ ආදායම් බද්ද ගණනය</u>** | | |
| බදුවන ආදායම x අදාල බදු අනුපාත (පළමුවන උපලේඛනය) | | xxx |
| (-) බදු බැර (Tax Credit) | | |
| • වාරික ගෙවීම් | (xx) | |
| • ESC ගෙවීම් | (xx) | |
| • රඳවා ගැනීමේ බදු (WHT) | (xx) | (xxx) |
| ඉතිරි ගෙවිය යුතු බදු වගකීම් (Balance tax payable) | | xxxx |

**සමාගම් සම්බන්ධව සුදුසුකම් ලබන ගෙවීම්**

➢ **පරිත්‍යාග**

A. පහත ආයතනයකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදුකල පරිත්‍යාග සීමාවකින් තොරව අඩු කළ හැකිය.

1. ශ්‍රී ලංකා රජයට
2. විශ්ව විද්‍යාල පනත යටතේ පිහිට වූ උසස් අධ්‍යාපන ආයතනයකට
3. බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට
4. ශ්‍රී ලංකා රජය විසින් පිහිට වූ අරමුදලකට
5. ප්‍රාදේශීය අධිකාරියක් මගින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලට
6. පළාත් පාලන ආයතනයකට
7. සෙවණ අරමුදලකට
8. පළාත් අධිකාරිය මඟින් ඇමතිවරයාගේ අනුමැතිය මත පිහිට වූ අරමුදලට
9. අපි වෙනුවෙන් අපි අරමුදලට
10. ජාතික වකුගඩු අරමුදලට
11. රාජ්‍ය සංස්ථාවක් මඟින් ජනාධිපති අරමුදලට කල ප්‍රේෂණ

JMC vLearning “your virtual learning partner”

B. අනුමත පුණ්‍යායතනයකට **මුදලින්** කළ පරිත්‍යාග පහත සීමාවන්ට යටත්ව අඩු කිරීමට ඉඩ දේ.

| | | | |
|---|---|---|---|
| උපරිමය | - 500,000 | | යන අගයන්ගෙන් වඩා අඩු අගය |
| හෝ | | | |
| 1/5 x මුලු තක්සේරුවන ආදායම | - xxx | | |
| | | xxx | යන අගයන්ගෙන් වඩා අඩු අගය |
| සත්‍ය මුදල් පරිත්‍යාග වියදම | | xxx | |
| | | | xxx |

C. 2020/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් ඒකාබද්ධ අරමුදලකට කරන ලද ගෙවීම් එම සංස්ථාවේ ආදායම් බද්ද ගණනය කිරීමේදී අඩු කරගත හැක.

**සමාගම් සඳහා බන බදු අනුපාත**

2020/04/08 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දැන්වීම අනුව, 2020/01/01 දින සිට (බලපැවැත්වෙන පරිදි) සංශෝධන යෝජනා කර ඇත.

(අ) සමාගමක බදු අය කළ හැකි ආදායම මත - 24%

(ආ) පහත දැක්වෙන විශේෂිත ව්‍යාපාර මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 14%
- කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්
- ගෙවීම විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන්නේ නම් සහ ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනන්නේ නම්, එවැනි භාණ්ඩ අලෙවි කිරීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
- නිශ්චිත ව්‍යාවසායන්
- ඉදිකිරීම්
- කෘෂි සැකසුම්
- සෞඛ්‍ය සේවා
- වාසික සමාගමකින් ලැබෙන ලාභාංශ

(ඇ) නිෂ්පාදනය මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 18%

(ඈ) ඔට්ටු ඇල්ලීම සහ සූදු මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 40%

(ඉ) මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන්, නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය කිරීම මගින් ලබන ලැබීම් සහ ලාභ මත - 40%

- **සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්**
  - (i) ශ්‍රී ලංකාව තුල පමණක් ව්‍යාපාර කටයුතු සිදු කරන තැනැත්තෙකු
  - (ii) අස්ථිත්වයක් වන ආශ්‍රිතයකු නොමැති තැනැත්තෙකු
  - (iii) එම තැනැත්තාගේ වාර්ෂික දල පිරිවැටුම රු. මිලියන 500 කට අඩුවන තැනැත්තෙකු

**නිශ්චිත ව්‍යාවසාය යන්නෙන්**

(a) අපනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම හා ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධ යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාමක නිරතව සිටින.

(b) එක් රටකින් භාණ්ඩ ප්‍රතිසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක්වෙරළ ව්‍යාපාරයක යෙදී සිටින.

(c) විදේශයන්හි සේවාදායකයන් සඳහා සේවා සැපයීමේ යෙදී සිටින.

(d) මූල්‍ය සැපයුම් ජාලය, බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැණුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලීය මෙහෙයුම් කටයුතුවල යෙදී සිටින.

(e) ශ්‍රී ලංකාවේ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශවීය ඒකාබද්ධ කිරීම් වැනි කාර්යය සම්පාදන සේවාවල යෙදී සිටින.

(f) අන්තර් නැව්ගත කිරීමේ කටයුතුවල යෙදී සිටින.

(g) භාණ්ඩ මෙහෙයුම් කටයුතුවල යෙදී සිටින.

(h) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන නැව් මෙහෙය වන්නන්ට සපයනු ලබන සේවා. (නැව් අලුත්වැඩියා ඇතුළුව)

(i) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන ශ්‍රී ලංකාව තුළදී මැණික් හෝ ස්වර්ණාභරණ අලෙවි කරන යම් ව්‍යවසායක් අදහස් වේ.